මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/14** **2024.10.08**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14
### තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම.

**තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ඒ සඳහා සුදුසුකම්ලත් රජයේ නිලධාරීන්/ ආරක්ෂක අංශ නිලධාරීන් හා තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත කරනු ලබන නිවේදනයයි**

2024 ඔක්තෝබර් 08 දින මධ්‍යම රාත්‍රී 12.00න් අවසන් වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ තැපැල් ඡන්ද අයදුම්පත්‍ර භාර ගැනීමේ දිනය, තැපෑලේ දී සිදුවිය හැකි ප්‍රමාදවීම් සහ කොමිෂන් සභාව වෙත කරනු ලැබූ ඉල්ලීම් සැලකිල්ලට ගෙන **2024 ඔක්තෝබර් මස 10 (බ්‍රහස්පතින්දා) දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා දීර්ඝ කළ බව මෙයින් නිවේදනය කරමි.** ඒ අනුව, අයදුම්පත්‍ර භාර ගැනීම අවසන් දිනයේ දී එනම්, **2024 ඔක්තෝබර් මස 10** දින මධ්‍යම රාත්‍රී 12.00ට පෙර ඒවා අදාල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ලැබිය යුතු වේ.

**අයදුම්පත්‍ර ලැබීමේ දී සිදුවිය හැකි ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා 2024 ඔක්තෝබර් මස 09 සහ 10 දෙදින තුළ සම්පූර්ණ කරන තැපැල් ඡන්ද අයදුම්පත්‍ර තැපැලට භාර දීමෙන් වැළකී ඒවා එක් එක් දිස්ත්‍රික් අනුව වෙන්කර වෙන වෙනම කවරවල බහා සහතික කිරීමේ නිලධාරී කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍ය බව දන්වා සිටිමි.**

**කිසිදු හේතුවක් මත මෙම දිනය නැවත දීර්ඝ නොකරනු ලබන බව ද සැලකුව මැනවි.**

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්